**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2017)

**පාසල්වල " ජාතික කියවීමේ මාසය වැඩසටහන - ඔක්තෝබර් " ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති අතර ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් වාර්ෂිකව මෙම මාසය සැමරීම පිණිස විවිධ කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. ඒ අනුව 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසය වෙනුවෙන් කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති කිහිපයක් පුස්තකාල මඟින් ක්‍රියාත්මක කරන මෙන් සියලුම පාසල්වලින් ඉල්ලා සිටිනු ලැබේ. පාසල් සිසුන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ කියවීමේ රුචිය වර්ධනය කිරීමත්, පුස්තකාල සම්පත් හා සේවාවන් ප්‍රවර්ධනය කිරීමත් මෙම වැඩසටහන්වල අරමුණු විය යුතු වේ.

## 02. කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුව

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සඳහා ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. දැනට ක්‍රියාත්මක පුස්තකාල කමිටුව මඟින් (අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල උපදෙස් සංග්‍රහයට අනුව පාසල් පුස්තකාල කමිටුවක් තිබීම අනිවාර්ය වේ.) මෙම කටයුතු සිදු කළ හැකි අතර, එසේ නොමැති නම් ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- විදුහල්පතිතුමා / නියෝජ්‍ය විදුහල්පතිතුමා - කමිටු සභාපති
- ගුරු පුස්තකාලයාධිපති / පුස්තකාලයාධිපති හෝ පුස්තකාලය භාර නිලධාරි - කමිටු ලේකම්
- විදුහල්පතිතුමා/තුමිය විසින් නම් කරනු ලබන වෙනත් ගුරුවරුන් දෙදෙනෙක්
- ගුරු දෙගුරු සංගමයේ සාමාජික මහත්ම මහත්මීන් දෙදෙනෙක්
- ශිෂ්‍ය නියෝජිතයින් හයදෙනෙක්

## 03. ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- කියවීම් කඳවුරු සංවිධානය, කියවීමේ තරග සංවිධානය
- බැනර්/උද්‍ධෘත පාඨ හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම (කියවීමේ අගය ගම්‍යවන පරිදි)
- හොඳම පාඨකයා සඳහා ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- විශේෂ තරග පැවැත්වීම (රචනා, චිත්‍ර, කථික, විවාද, නාට්‍ය, ගායනා, අත් අකුරු)
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම
- බිත්ති පුවත්පත්, සමරු කලාප, සඟරා පළ කිරීම
- පුස්තකාලය පිළිබඳව අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම
- ශ්‍රමදාන /පුස්තකාල අලංකරණය ආදී කටයුතු සිදු කිරීම
- පරිගණක යන්ත්‍ර හා අන්තර්ජාල සම්බන්ධතා ලබා ගැනීම
- සම්මන්ත්‍රණ හා දේශන සංවිධානය කිරීම, සාහිත්‍ය විචාර, සංවාද ආදිය පැවැත්වීම.
- අරමුදල් රැස්කිරීම, පොත් මිලට ගැනීම හා පරිත්‍යාග ලබා ගැනීම, පරිත්‍යාග ලබාදීම වැනි කටයුතු හා උපකරණ අලුතින් ලබා ගැනීම
- අන්තර්ජාලය හරහා තොරතුරු ගවේෂණයට හුරුකරවීමේ වැඩසටහන් පැවැත්වීම
- අන්තර්ජාල සේවා පිළිබඳ වැඩමුළු/සම්මන්ත්‍රණ/දේශන සංවිධානය කිරීම
- කතන්දර පැය, චිත්‍රපට හා වීඩියෝ දර්ශන ආදී විවිධ විනෝදජනක වැඩසටහන් මඟින් කියවීමේ රුචිය වර්ධනය කරලීම.
- නිවැරදි කියවීමේ ක්‍රමවේද හඳුන්වා දීම.

- ඔක්තෝබර් මාසය තුළ එක් දිනයක නිශ්චිත වේලාවක් තෝරා ගෙන කියවීමේ වැඩසටහනක් පන්ති මට්ටමින් පැවැත්වීම
- පාසල් පුස්තකාල දිනය සැමරීමේ වැඩසටහන පැවැත්වීම (ඔක්තෝබර් මස අවසාන සතියේ සඳුදා දිනය)
- පාඨක සමාජ පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම
- ගවේෂණ චාරිකාවල යෙදීම සහ පා ගමන් සංවිධානය කිරීම
- පාසල් සිසු සිසුවියන් අතර වඩාත් ජනප්‍රිය පොත් දහය ඡන්දයෙන් තේරීම
- යම් පොතක හෝ පොත් කිහිපයක හෝ කර්තෘන් ආරාධිතයන් ලෙස පාසලට ගෙන්වා වැඩසටහනක් පැවැත්වීම
- යම් ලේඛකයෙක්/ලේඛිකාවක් පාසලට ගෙන්වා ඔහු/ඇයගේ කෘති ඇගයීමට ලක් කිරීම
- පොත් කියවීම පිණිස විවෘත කුඩාරමක්/මඩුවක් පාසල් මිදුලේ ගොඩනැංවීම.
- සැම පාසල් සිසුවෙකුගේ/සිසුවියකගේ නිවසේ ගෘහස්ත පුස්තකාලයක් ආරම්භ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- පාසල් පුස්තකාලය සඳහා Facebook ගිණුමක් නිර්මාණය කිරීම
- පුස්තකාලය පිළිබඳ තොරතුරු හා ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටියක් නිර්මාණය කිරීම
- කියවීමේ රුචිය, සාහිත්‍ය, ලේඛන කලාව, තොරතුරු තාක්ෂණය, කියවීමේ අගය වැනි මාතෘකා පිළිබඳ ලිපි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පළ කිරීම (ආචාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ නිර්මාණ)
- ජයග්‍රාහකයින්ගේ කුසලතා ඇගයීම සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් සංවිධානය කිරීම

## 04. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම කළ යුතු නොවේ. පාසලේ පොදු අරමුදලින් කොටසක් ද, පාසල් සංවර්ධන සමිතියේ අරමුදලින් කොටසක් ද, යෙදවීම ප්‍රමාණවත් වන අතර කමිටුව මඟින් ව්‍යාපෘති වාර්තා සම්පාදනය කර රාජ්‍ය ආයතන, බැංකු, සිවිල් සංවිධාන, ප්‍රදේශයේ දානපතියන්, ව්‍යාපාරිකයන් වෙත ඉදිරිපත් කර මූල්‍ය අනුග්‍රහය ලබාගැනීම සුදුසු ය.

## 05. ඇගයීම

සිදු කරන ලද සියලු වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් ඡායාරූප හා වෙනත් සාධක සහිතව (මුද්‍රිත/සංයුක්ත තැටි) සකස් කර විදුහල්පතිතුමාගේ නිර්දේශ සමඟ ***2018 මාර්තු මස 31*** වන දිනට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට යොමු කළ යුතුය. මේ බව සඳහන් ආවරණ ලිපියේ පිටපතක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර ඔහුගේ නිර්දේශ සහිතව එම ලිපිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

ජාතික කියවීමේ මාසයේ ඵලදායී වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2018 ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ. එසේම පුස්තකාල පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහන්වලදී එම පුස්තකාල සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ
සභාපති

ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07.

විමසීම් - දුරකථන අංකය - 011-2698847, ෆැක්ස් 011-2674387, වෙබ් අඩවිය - www.natlib.lk